# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## තනතුරු පුරප්පාඩු
## ආරක්ෂක පරීක්ෂක (කොන්ත්‍රාත් පදනම මත)

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින ආරක්ෂක පරීක්ෂක තනතුර සඳහා ත්‍රිවිධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ වසර 12කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

1. අ: දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබිය යුතුය. එසේ සම්මාන සාමාර්ථ ලබාගත් විෂයයන් අතරට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය යන විෂයන් ඇතුළත් විය යුතුය.

   හෝ

   ආ: තුන්වරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව ඇත්තා වූ සහ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවකයින් විය යුතුය. සමත්ව ඇති විෂයයන්ට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය යන විෂයන් ඇතුළත් විය යුතුය.

   සහ

2. පොලිස් හෝ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක ආරක්ෂක සේවයේ හෝ පිළිගත් ආරක්ෂක සේවා ආයතනයක ආරක්ෂක සේවයේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
3. ක්‍රීඩාවන්හි ක්‍රියාශීලී ලෙස සහභාගි වී තිබිය යුතුය.
4. උස : අඩි 5 අඟල් 4 කට නොඅඩු විය යුතුය.
   පපුව : අඟල් 34 කට නොඅඩු විය යුතුය. (සාමාන්‍ය)
5. වයස අවුරුදු 50ට නොවැඩි විය යුතුය.

- ❖ **වැටුප** - **රු. 55000.00 (මාසික ස්ථාවර)**
- ❖ **කොන්ත්‍රාත් කාලසීමාව** - **වසර 01**
- ❖ **ප්‍රතිලාභ** - **විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට හිමිකම් ලබයි.**
- ❖ **තෝරා ගැනීම** - **සම්මුඛ පරීක්ෂණයක් මගින්**

අයදුම්පත කැලණිය විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියෙන් https://news.kln.ac.lk/index.php/classified/vacancies/ හෝ කැලණිය විශ්වවිද්‍යාලයේ ආයතන අනධ්‍යයන අංශය වෙත පැමිණ ලබා ගත හැක. එසේ ලබා ගන්නා ලද අයදුම්පත නිසිලෙස සම්පූර්ණ කර අදාළ සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතිකවල පිටපත්ද, සේවය කරන ලද ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හෝ රාජ්‍ය ආරක්ෂක සේවාවෙන් නීත්‍යානුකූලව ඉවත්වීමේ ලිපියෙහි හා ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත්, පදිංචිය සනාථ කිරීම සඳහා තමන් පදිංචි ග්‍රාම සේවක කොට්ඨාශයෙහි ග්‍රාම නිලධාරි සහතිකය සහ චරිත

සහතික 2ක් (මෙයින් එකක් තමන් පදිංචි ප්‍රදේශයෙහි විහාරස්ථානයේ විහාරාධිපති හිමියන්ගෙන් ලබාගත් සහතිකයක් විය යුතුය) සමග 2023.01.31 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ සහකාර ලේඛකාධිකාරි/ආයතන අනධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරෙහි ආරක්ෂක පරීක්ෂක (කොන්ත්‍රාත් පදනම මත) ලෙස සඳහන් කල යුතුය.

2023.01.31 දිනෙන් පසුව ලැබෙන සහ/හෝ අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචි අයට විශේෂත්වයක් දක්වනු ලැබේ.

- මෙම බඳවාගැනීම සම්බන්ධයෙන් පාලක සභාවේ තීරණය අවසන් තීරණය වන බව සියලුම අයදුම්කරුවන් වෙත කාරුණිකව දන්වමි.

**ලේඛකාධිකාරි**
**16.01.2023**